# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 01/2015**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2015, ජනවාරි මස 22 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් ගාස්තු හා ගමන් වියදම්</u>

2003.12.29 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 837, 2013.04.24 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2013 හා 2012.04.16 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 07/2012, 2013.05.17 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 07/2013, 2014.02.10 දිනැති ලිපි අංක යුජීසි/එච්ආර්/6/1/13(I) සහ 2009.06.03 දිනැති ලිපි අංක යුජීසි/අයියුජ්/2/පීජීඑස්/6 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. 888 වන කොමිෂන් සභා වාරයේදී විශ්වවිද්‍යාල වල බාහිර කථිකාචාර්යවරුන්ගේ ගාස්තු පහත වගුවෙහි දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට තීරණය කරන ලදී.

| | | | | සංශෝධිත රේටය (පැයක් සඳහා) (රු.) |
|---|---|---|---|---|
| 1. | පශ්චාත් උපාධි පාඨමාලා | දේශන | | විශ්වවිද්‍යාල පාලන අධිකාරිය විසින් රේටය තීරණය කළ හැකිය* |
| | | ප්‍රායෝගික | | |
| 2. | උපාධි පාඨමාලා | දේශන | | 1500/- |
| | | ප්‍රායෝගික | | 600/- |
| 3. | උපාධි මට්ටමට පෙර පවත්වනු ලබන පාඨමාලා | දේශන | | 900/- |
| | | ප්‍රායෝගික | | 450/- |
| 4. | උපදේශකවරයෙකු සඳහා | ඉංග්‍රීසි | පැය පදනමින් බඳවා ගෙන ඇති | 750/- |
| | | | කඩිනම් ඉංග්‍රීසි පාඨමාලා සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති | 18000/- (මාසිකව) - සතියකට පැය 25 ක අවමයකට යටත්ව |
| | | ඉංග්‍රීසි නොවන අනිකුත් | | 750/- |

* විශ්වවිද්‍යාල මගින් මුදල් අයකරමින් පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා වල දේශන පැයක් හෝ ප්‍රායෝගික පැයක් සඳහා රු. 1000/- ක අවමයකට යටත්ව විශ්වවිද්‍යාල පාලන අධිකාරිය විසින් තීරණය කරනු ලබන රේටයකින් ගෙවීම් කළ හැකිය. මෙම ගෙවීම් විශ්වවිද්‍යාලය විසින් උපයා ගනු ලබන මුදල් මගින් ආවරණය කර ගත යුතු වේ.

3. මීට අමතරව වර්තමානයේ රජය විසින් අනුමත ප්‍රවාහන දීමනා ගෙවනු ලබයි.

4. තවද, 2014.12.18 වන දින පැවති 908 වන කොමිෂන් සභා වාරයේදී විශ්වවිද්‍යාල වල විශේෂිත විෂය ක්ෂේත්‍ර වල සේවය සඳහා අවශ්‍ය වු විටක ටෙලි සම්මන්ත්‍රණ (Teleconference) සහ ස්කයිප් තාක්ෂණය

(Skype) ඔස්සේ යොදාගනු ලබන විදේශ විශේෂඥයින් වෙනුවෙන් පැයකට ඇමරිකන් ඩොලර් 50ට අඩු නොවන හා ඇමරිකන් ඩොලර් 100ක උපරිමයකට යටත්ව ගෙවීම් සිදුකල හැකි බව තීරණය විය.

5. බාහිර කථිකාචාර්ය වරුන් බඳවා ගැනීමේදී මහා භාණ්ඩාගාරය විසින් පනවා ඇති පහත කොන්දේසි සියල්ල තෘප්තිමත් වන ලෙස කටයුතු සිදු කරීමට උසස් අධ්‍යාපන ආයතන වෙත උපදෙස් දෙනු ලබයි.

- අ). කුමන පරිපාටිය යටතේ හෝ බාහිර කථිකාචාර්ය වරුන් බඳවා ගැනීමට අදාල උසස් අධ්‍යාපන ආයතනය තුල ඒ සඳහා පහසුකම් හා අවශ්‍යතාවය පැවතිය යුතුය.
- ආ). උසස් අධ්‍යාපන ආයතනය විසින් බාහිර කථිකාචාර්ය වරුන් බඳවා ගැනීමට පෙර උපාධි පාඨමාලා හා පශ්චාත් උපාධි පාඨමාලා වල ආචාර්ය වරුන් සියළු දෙනා සම්පූර්ණයෙන්ම සේවයේ යොදවා සිටිය යුතුයි.
- ඇ). මේ සම්බන්ධයෙන් අමතර අරමුදල් සඳහා වන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

6. 2003.12.29 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 837, 2013.04.24 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 07/2013 හා 2012.04.16 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 07/2012, 2013.05.17 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 07/2013, 2014.02.10 දිනැති ලිපි අංක යූජීසී/එච්ආර්/6/1/13(I) සහ 2009.06.03 දිනැති ලිපි අංක යූජීසී/අයියූඒ/2/පීජීඑස්/6 මෙයින් අවලංගු කෙරේ.

7. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෝ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ජ්‍යෝ.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූජීසී/එච්ආර්/6/1/13(I)